# විශ්වාසයේ අනිවාර්ය කරුණු

أركان الإيمان

Moulaviya M.Y.Maziyya B.A,(Hons)

නිශ්චයෙන්ම ප්‍රකාශයේ හා ක්‍රියාවේ වලංගුභාවය හා පිළිගැනීම පවතින්නේ, නිවැරදි ප්‍රතිපත්තිය මත බව අල් කුරානයේ හා අල් හදීසියේ ආධාර මාර්ගයෙන් දැන ගන්නට ලැබේ. එනිසා ප්‍රතිපත්තිය නිවැරදි නොවන්නේද, එවිට එම ප්‍රතිපත්තියෙන් සිදුවන සියළු ප්‍රකාශයන් හා ක්‍රියාවන් අවලංගුවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

وَمَن يَكْفُرْ بِالإِيمَانِ فَقَدْ حَبِطَ عَمَلُهُ وَهُوَ فِي الآخِرَةِ مِنَ الْخَاسِرِينَ

තවද, කවරෙකු විශ්වාසකිරීම ප්‍රතික්ෂේප කරන්නන්ද, ඔහුගේ ක්‍රියාව විනාශවේ. තවද ඔහු පරලොවෙහි අලාභයට පත්වූ අය සමඟ සිටී. (අල්කුර්ආන් 5: 5)

وَلَقَدْ أُوحِيَ إِلَيْكَ وَإِلَى الَّذِينَ مِنْ قَبْلِكَ لَئِنْ أَشْرَكْتَ لَيَحْبَطَنَّ عَمَلُكَ وَلَتَكُونَنَّ مِنَ الْخَاسِرِينَ

තවද, (නබිතුමනී) ඔබ (දෙවියාට) ෂිර්ක් කිරීමෙහි යෙදෙන්නේද, ඔබගේ ක්‍රියා සියල්ල විනාශවේ. ඔබ අලාභ කරුවන්ගෙන් කෙනෙකු ලෙස පත්වේ. යනුවෙන් ඔබටත් ඔබට පෙර සිටී අයටත් වහී (දේව පණිවුඩ) මගින් පවසන ලදී. (අල්කුර්ආන් 39: 65)

නිශ්චයෙන්ම නිවැරදි ප්‍රතිපත්තිය (අකීදා) වන්නේ, අල්ලාහ්ද, ඔහුගේ මලක්වරුන්ද, ඔහුගේ දේව ග්‍රන්ථද, ඔහුගේ දූතයන්ද, අවසාන දිනයද, හා ඉරණමද චිත්ත පාරිශුද්ධියෙන් විශ්වාස කිරීම බව අල්කුර්ආනය හා අල් හදීසය අනාවරණය කරයි. එබැවින්, මෙම කරුණු හය නිවැරදි (පැහැදිළි) මූලික ප්‍රතිපත්තියෙකි. කුමක්නිසාදයත්, අල්ලාහ් දේව ග්‍රන්ථ පහළ කළේද, මුහම්මදු (සල්) තුමා එව්වේද, මෙම නිවැරදි ප්‍රතිපත්තිය කරාය. මෙය ඊමාන් (විශ්වාස කිරීමේ) අනිවාර්ය කරුණු ලෙස හැඳින්වේ.

## 1. අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම

මෙය නැමදීමට සුදුස්සා හා හිමිකාරයා අල්ලාහ් හැර අන් කිසි කෙනෙකු නොමැති බව විශ්වාස කිරීමයි. කුමක්නිසාදයත්, ඔහු ඔහුගේ දාසයන් මවන්නාය. ඔවුන්ට උපකාර කරන්නාය. ආහාර සපයන්නාය. ඔවුන්ගේ රහස හා පරහස දැන සිටින්නාය. ඔවුන්ගෙන් අවනතවන්නන්ට (ඇදහීම් කරන්නන්ට) ත්‍යාගද, පාපකරුවන්ට දඬුවමද ලබාදීමට ශක්ති වන්තයාය. අල්ලාහ් මිනිස් හා ජින් වර්ගයන් මවා මෙම ඇදහීම් ඉටු කිරීම සඳහා ඔවුන්ට අණ කළාය. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

وَمَا خَلَقْتُ الْجِنَّ وَالْإِنسَ إِلَّا لِيَعْبُدُونِ . مَا أُرِيدُ مِنْهُم مِّن رِّزْقٍ وَمَا أُرِيدُ أَن يُطْعِمُونِ . إِنَّ اللَّهَ هُوَ الرَّزَّاقُ ذُو الْقُوَّةِ الْمَتِينُ

තවද, ජින් හා මිනිස් වර්ගයන් මාහට ඉබාදත් (සම්පූර්ණයෙන් අවනතවී මාගේ අණ පිළිගෙන ජීවත්වීමට හා මාහට පමණක් වැඳුම් පිදුම්) කිරීමට හැර මා මැවූයේ නැත. මා කිසියම් සම්පතක් හෝ ඔවුන්ගෙන් අපේක්ෂා නොකරමි. මට ඔවුන් ආහාර සැපයීමද අපේක්ෂා නොකරමි. නියතවශයෙන්ම අල්ලාහ් තආලා ආහාර සපයන්නාය. බලවත් ශක්ති වන්තයාය. (අල්කුර්ආන් 51: 56-58)

අල්ලාහ් තආලා දූතයන් එව්වේද, දේව ග්‍රන්ථ පහළ කළේද මෙම සත්‍යතාවය පැහැදිළි කිරීමටත් එය කරා කැඳවීමටත් එයට විරුද්ධ දේයින් වැළකී සිටීමටත්ය. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

وَلَقَدْ بَعَثْنَا فِي كُلِّ أُمَّةٍ رَّسُولاً أَنِ اعْبُدُواْ اللّهَ وَاجْتَنِبُواْ الطَّاغُوتَ

නියතවශයෙන්ම ඔබ අල්ලාහ්ටම වැඳුම් පිදුම් කරන්න. තාගූත් (ෂෛතාන්) වරුන්ගෙන් වැළකින්න. යනුවෙන් පැවසීම සඳහා අපි සෑම සමාජයටම රසූල්වරුන් (දූතයන්) එව්වෙමු. (අල්කුර්ආන් 16: 36)

මෙම ඉබාදතයෙහි යථාර්තය වන්නේ, ප්‍රාර්ථනා කිරීම, බියවීම, අපේක්ෂා කිරීම, නැමදීම, උපවාසයේ යෙදීම, කැපීම, භාර ඔප්පු කිරීම හා වෙනත් ඇදහීම් සියල්ල අල්ලාහ් වෙනුවෙන් යන චිත්ත පාරිශුද්ධියෙන් ඔහු ඒකත්වය කිරීමයි. මෙය සම්පූර්ණ ආදරයෙන් යුත් ඇල්මෙන්ද, බියෙන්ද තිබිය යුතුයි. කුර්ආනයෙහි අධික ලෙස සඳහන් වන්නේ මෙම වැදගත් මූලික කරුණු පිළිබඳවයි. අල්ලාහ් මේ ගැන මෙසේ පවසන්නේය.

فَاعْبُدِ اللَّهَ مُخْلِصًا لَّهُ الدِّينَ . أَلَا لِلَّهِ الدِّينُ الْخَالِصُ

ඔබ ආගම කෙරෙහි පාරිශුද්ධියෙන් අල්ලාහ් නමදින්න. දැනගන්න, පාරිශුද්ධ ආගම (ට අයත් නැමඳුම් සියල්ල) අල්ලාහ්ටම හිමිවේ. (අල්කුර්ආන් 39: 2,3)

وَقَضَى رَبُّكَ أَلاَّ تَعْبُدُواْ إِلاَّ إِيَّاهُ

ඔහුට පමණක් හැර (අන් කිසිවෙකුට) ඔබ නොඇදහන ලෙස ඔබේ දෙවියා නියම කරයි. (අල්කුර්ආන් 17: 23)

فَادْعُوا اللَّهَ مُخْلِصِينَ لَهُ الدِّينَ وَلَوْ كَرِهَ الْكَافِرُونَ

එනිසා, කාෆිර්වරුන් ප්‍රතික්ෂේප කළත්, ඔබගේ ආගම (සම්පූර්ණයෙන්ම) අල්ලාහ්ටම හිමිකරමින් චිත්ත පාරිශුද්ධියෙන් ඔහු වෙතම ප්‍රාර්ථනා අයාදින්න. (අල්කුර්ආන් 40: 14)

අල්ලාහ් තම දාසයන්ට අනිවාර්ය කළ සියළු දේ හා ඉස්ලාමයෙහි භාහිර

කරුණු මගින් ඔවුන්ට නියම කළ දේ විශ්වාස කිරීමද, අල්ලාහ් විශ්වාස කිරීමෙකි. ඒවා, වැඳුම් පිදුම් කිරීමට අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බවත්, නබි (සල්) තුමා අල්ලාහ්ගේ දූතයා බවත් සාක්ෂි දීම, සලාත් නැමැදුම ඉටුකිරීම, සකාතය ගෙවීම, රාමසාන් උපවාසයේ යෙදීම හා ශක්තිවන්තයන් හජ් කර්තව්‍යය ඉටුකිරීම යනාදීයන්ද, ෂරීආ (ආගම) අනිවාර්ය කළ වෙනත් කාර්යයන්ද වේ. මෙයින් උතුම් හා වැදගත් කරුණු වන්නේ ලාඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහි යන්නේය.

මෙම විශ්වය මැව්වේද, තම ඥානය හා ශක්තිය මත ලොවැසියන් පාලනය කරන්නේද අල්ලාහ්ය. ඔහු මෙලොව හා පරලොව පාලනය කරන්නාය. සැම විශ්වයන්ගේ පාලකයාය. ඔහු හැර කිසියම් මවන්නෙකුද, පාලකයෙකුද නොමැත. ඔහු රසූල්වරුන් එව්වේද, දේව ග්‍රන්ථ පහළ කළේද දාසයන් ශීලාචාර කිරීමටද, ඔවුන්ගේ ජයග්‍රහණය උදෙසා කැඳවීමටද මෙලොව හා පරලොවෙහි ඔවුන්ගේ යහපතද උදෙසාය. මේ සියල්ලෙහි ඔහුට සමානව කිසියම් දෙයක් නොමැත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

اللَّهُ خَالِقُ كُلِّ شَيْءٍ وَهُوَ عَلَى كُلِّ شَيْءٍ وَكِيلٌ

අල්ලාහ් සියළු දේ මවන්නාය. තවද, ඔහු සැම දේ කෙරෙහි (සියළු) වගකිව යුත්තාය. (අල්කුර්ආන් 39: 62)

කුර්ආනයෙහි හා නබිතුමාගේ වදන්වල සඳහන් අල්ලාහ්ගේ අලංකාර නාමයන් හා ශ්‍රේෂ්ඨ ලක්ෂණයන් කිසුදු වෙනස් කිරීමෙන්, වසංකිරීමෙන්, රූපකිරීමෙන් හා උදාහරණය කිරීමෙන් තොරව විශ්වාස කිරීමද අල්ලාහ් විශ්වාස කිරීමෙකි. ඒ සමගම, මෙම නාමයන් හා ලක්ෂණයන් මැවීම්වලට ඔප්පු නොකර, ලක්ෂණ කිරීමට සුදුස්සාවූ අල්ලාහ්ගේ මෙම නාමයන් හා ලක්ෂණයන් දැනුම් දෙන කරුණුද විශ්වාස කළ යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

لَيْسَ كَمِثْلِهِ شَيْءٌ وَهُوَ السَّمِيعُ الْبَصِيرُ

ඔහු හා සමාන කිසි දෙයක් නොමැත. ඔහු (සැම දේ) කන්දී නෙත් යොමා සිටින්නාය. (අල්කුර්ආන 42: 11)

## 2. මලක්වරුන් විශ්වාස කිරීම

මලක්වරුන් පිළිබඳ විශ්වාසය පොදුවෙන් හා පුළුල් වශයෙන් පවතී. එහෙයින්, මුස්ලිම්වරයෙකු අල්ලාහ්ට ඔහු විසින් මවනලද මලක්වරුන් සිටින බවත්, ඔවුන් තමාගේ දෙවියා කෙරෙහි ඇදහීමෙහි නිරතවී සිටින බවත් විශ්වාස කළ යුතුයි. ඔවුන් විවිධ කණ්ඩායම් වශයෙන් සිටිති. ඔවුන්ගෙන් අර්ෂය (අල්ලාහ්ගේ

සිංහාසනය) උසුලා සිටින අයද, ස්වර්ගය හා අපාය භාර අයද, දායසයන්ගේ ක්‍රියාවන් රකින අයද සිටිති. එසේම පුළුල් වශයෙන් අල්ලාහ් හා නබිතුමා නම් කළ අයද විශ්වාස කළ යුතුයි. ඔවුන් ජිබ්රීල්, මීකාර්ල්, අපායේ භාරකරු මාලික්, සූර් පිඹීම භාර ඉස්රාෆීල් හා මෙවැන්නන්ය. මලක්වරුන් ගැන නබිතුමා පැවැසූ බව ආයිෂා (රලි) තුමිය මෙසේ පවසන්නීය.

(رواه مسلم) [خلقت الملائكة من نور، وخلق الجان من مارج من النار، وخلق آدم مما وصف لك]

මලක්වරුන් ආලෝකයෙන්ද, ජින්වරුන් දල්වන ගින්නෙන්ද, ආදම් (ප්‍රථම මිනිසා හා නබිවරයාවූ) ඔබලාට වර්ණනා කළ දේයිද (පස්වලින්ද) මවනලද්දේය.
(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

## 3. දේව ග්‍රන්ථ විශ්වාස කිරීම

අල්ලාහ් තම යථාර්තය පැහැදිළි කිරීම හා ඔහු කරා කැඳවීම සඳහා ඔහුගේ වක්තෘ (නබි) වරුන්ට හා දූත (රසූල්) වරුන්ට දේව ග්‍රන්ථ පහළ කළ බව කෙටියෙන් (පොදුවෙන්) විශ්වාස කළ යුතුයි. පුළුල් වශයෙන් තව්රාත්, ඉන්ජීල්, සබූර් හා කුර්ආනය යනාදී අල්ලාහ් නම් කළ දේව ග්‍රන්ථයන් විශ්වාස කළ යුතුයි. අල්කුර්ආනය ඒවායින් ශ්‍රේෂ්ඨ හා අවසාන ග්‍රන්ථයෙකි. මෙය අනෙකුත් දේව ග්‍රන්ථයන් ආරක්ෂා හා සත්‍ය කරයි. මෙය සෑම මිනිස් සමාජයන්ම පිළිපැදීමද, නබි (සල්) තුමාගේ සුන්නා (හදීස්) නිවැරදි කළ දේ මගින් තීන්දු කිරීමද අනිවාර්යවේ. මක්නිසාදයත්, අල්ලාහ් මුහම්මදු (සල්) තුමාව සියළු දේවර්ගයන් (ජින් හා මිනිස්) කරා එව්වේය. තවද, ඔවුන් අතර තීන්දු කිරීම සඳහාද, ඔවුන්ගේ සිතෙහි දේ (රෝගය)ට ඖෂධය වශයෙන්ද, සියළු දේ පැහැදිළි කිරීමක් වශයෙන්ද, සියළු ලොව වැසියන්ට යහමග හා කරුණාව වශයෙන්ද මෙම කුර්ආනය ඔහුට පහළ කළාය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

وَهَذَا كِتَابٌ أَنزَلْنَاهُ مُبَارَكٌ فَاتَّبِعُوهُ وَاتَّقُوا لَعَلَّكُمْ تُرْحَمُونَ

මිනිසුනි, මෙයද ධර්ම ග්‍රන්ථයෙකි. මෙය අපි පහළ කළෙමු. මෙය ප්‍රසංසාලද ග්‍රන්ථයෙකි. එබැවින් ඔබලා මෙය පිළිපදින්න. තවද, ඔබලාට කරුණාව ලැබීම සඳහා ඔහුට බිය වන්න. (අල්කුර්ආන් 6: 155)

وَنَزَّلْنَا عَلَيْكَ الْكِتَابَ تِبْيَانًا لِّكُلِّ شَيْءٍ وَهُدًى وَرَحْمَةً وَبُشْرَى لِلْمُسْلِمِينَ

නබිතුමනි,) මෙම ග්‍රන්ථය සියළුදේ පැහැදිළි කිරීමක්, යහමග යොමු කිරීමක්, දයාව සැලසීමක් හා සුභාරංචියක් වශයෙන් මුස්ලිම්වරුන්ට පහළ කළෙමු. (අල්කුර්ආන් 16: 89)

## 4. රසූල්වරුන් විශ්වාස කිරීම

පොදුවෙන් හා පුළුල් වශයෙන් රසූල්වරුන් විශ්වාස කිරීම අවශ්යයයි. එනිසා, නිශ්චයවශයෙන්ම අල්ලාහ් තම දාසයන් වෙත සුභාරංචි පතන, අවවාද කරන, යථාර්තය කරා කැඳවන රසූල්වරුන් (දූතයන්) එවූ බව විශ්වාස කළ යුතුයි. එනිසා කවරෙකු ඔවුන්ට ඇහුම්කම් (උත්තර) දෙන්නේද ඔහු භාග්යවන්ත ජයග්රාහිකයාය. තවද, කවරෙකු හෝ ඔවුන්ට විරුද්ධවන්නේද, ඔහු පරාජයට හා ශෝකයට පත්වන්නාය. ඔවුන්ගෙන් අවසාන හා ශ්රේෂ්ඨවන්තයා මුහම්මදු නබිතුමාය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

وَلَقَدْ بَعَثْنَا فِي كُلِّ أُمَّةٍ رَّسُولاً أَنِ اعْبُدُواْ اللّهَ وَاجْتَنِبُواْ الطَّاغُوتَ

සත්යවශයෙන්ම, අල්ලාහ්ට වැඳුම් පිඳුම් කරන්න. තාගූත් (අල්ලාහ් හැර ඇදහීම් කරන අන් සියල්ල) ගෙන් ඈත්වන්න. යනුවෙන් දේශනා කිරීම සඳහා සෑම සමාජයක් කරාම අපි දූතයන් එව්වෙමු. (අල්කුර්ආන් 16: 36)

مَّا كَانَ مُحَمَّدٌ أَبَا أَحَدٍ مِّن رِّجَالِكُمْ وَلَكِن رَّسُولَ اللَّهِ وَخَاتَمَ النَّبِيِّينَ

මුහම්මදු (සල්)තුමා ඔබලාගේ කිසියම් පුරුෂයෙකුට පියෙකු ලෙස නොසිටියේය. නමුත්, ඔහු අල්ලාහ්ගේ දූතයා හා අවසාන නබිවරයා ලෙස සිටියේය. (අල්කුර්ආන් 33: 40)

පුළුල් වශයෙන් හා විශේෂයෙන් අල්ලාහ් හා නබි (සල්) තුමා නම් සඳහන් කළ රසූල් (දූත) වරුන් විශ්වාසකළ යුතුයි. ඔවුහු නූහ්, හූද්, සාලිහ්, ඉබ්රාහීම් හා වෙනත් නබිවරුන්ය. එතුමන්ට හා නබි තුමාට අල්ලාහ්ගේ උතුම් දයාව හා කරුණාව ලැබෙනු මැන.

## 5. අවසාන දිනය විශ්වාස කිරීම

අල්ලාහ් හා නබිතුමා පැවැසූ, මරණයෙන් පසු සිදුවන සියළුදේ කෙරෙහි විශ්වාස කිරීම මෙයට අදාලවේ. එනම්, මිනීවළෙහි නොසන්සුන්තාවය, එහි භාග්ය හා වේදනාව, පරලොවෙහි සිදුවන බියජනකය හා අසීරුතාවය, සිරාත් පාලම, මීසාන් තරාදිය, ප්රශ්න කිරීම, ත්යග පිරිනැමීම, මිනිසුන් අතර (කුසල් හා අකුසල් ක්රියා සඳහන්) පුස්කොළය බෙදීම, එය වමතින් ලබා ගැනීම, දකුණතින් හෝ පිටිපසින් ලබාගැනීම යනාදීය විශ්වාස කළ යුතුයි.

තවද, නබිතුමාට පිරිනැමූ පොකුණ, ස්වර්ගය, අපාය, විශ්වාස වන්තයන් අල්ලාහ් බැහ දැකීම, ඔවුන් සමග අල්ලාහ් කතා කිරීම සහ කුර්ආනය හා හදීසය මගින් ලැබූ මෙවැනි වෙනත් කරුණු ගැන විශ්වාස කළ යුතුයි. තවද එය අල්ලාහ් හා නබිතුමා පැහැදිලි කළ අයුරින්ම තහවුරු කළ යුතුයි.

## 6. කළා හා කද්ර් (ඉරණම) විශ්වාස කිරීම

මෙම විශ්වාසය කරුණු හතරක් මත පවතී.

1. නිශ්චය වශයෙන්ම, අල්ලාහ් පෙර සිදුවූ හා පසුව සිදුවන්නට යන දේද, තම දාසයන්ගේ ස්වභාවය, ආහාර පානය, ආයුෂ කාලය, ක්‍රියාව හා ඔවුන්ගේ වෙනත් කාර්යයන්ද දැන සිටින්නාය. ඔහුට කිසිඳු දෙයක් සැඟවිය නොහැක. අල්ලාහ් මෙසේ පවසන්නේය.

   إِنَّ اللّه بِكُلِّ شَيْءٍ عَلِيمٌ

   නිශ්චයවශයෙන්ම අල්ලාහ් සියළු දේම දැන සිටින්නාය. (අල්කුර්ආන් 9: 115)

2. ඔහු සැලැසුම් කළ හා තීරණය කළ සියළු දේ ලිඛිතව තිබීම. අල්ලාහ් මෙසේ පවසන්නේය.

   وَكُلَّ شَيْءٍ أحْصَيْنَاهُ فِي إمَامٍ مُبِينٍ

   තවද, සෑම දෙයක්ම අපි පැහැදිලි ග්‍රන්ථයෙහි ආරක්ෂා කොට තිබෙන්නෙමු. (අල්කුර්ආන් 36: 12)

3. ඔහුගේ පැවැතීමේ හැකියාව විශ්වාස කිරීම, එය ඔහු සිතන දේ සිදුවීම හා නොසිතන දේ නොසිදුවීමය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

   كَذَلِكَ اللّهُ يَفْعَلُ مَا يَشَاءُ

   එසේම අල්ලාහ් තමා සිතන දේ කරන්නේය. (අල්කුර්ආන් 3: 40)

4. ඔහු ලොවෙහි සියළු දේ මැවීම, ඔහු හැර මවන්නෙකු හා පාලකයෙකු නොමැත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

   ذَلِكُمُ اللّهُ رَبُّكُمْ لا إلَهَ إلاَّ هُوَ خَالِقُ كُلِّ شَيْءٍ فَاعْبُدُوهُ وَهُوَ عَلَى كُلِّ شَيْءٍ وَكِيلٌ

ඔහුතමා ඔබලාගේ දෙවියාවූ අල්ලාහ්ය. ඔහු හැර අන් කිසි දෙවියෙදු නොමැත. සැමදේ මවන්නා ඔහුය. එබැවින්, ඔහුටම අවනතවී වැඳුම් පිදුම් කරන්න. තවද, ඔහුතමා සියළු කාර්යයන් නිරීක්ෂන කරන්නාය. (අල්කුර්ආන් 6: 102)